ලෝක දිවි තොර කරගැනීම් වැළැක්වීමේ දිනයට තව දින 4 යි!

ඝාතන-දිවි තොර කරගැනීම් සාපේක්ෂව දුර්ලභ වුවත්, එවැනි සිදුවීම් සඳහා සමාජය තුළත්, මාධ්‍ය තුළත් වැඩි අවධානයක් ලැබේ.

එනිසා, එවැනි සිදුවීම් වැඩි ප්‍රවේසමක් සහිතව වාර්තා කිරීමත්, එසේ වාර්තා කිරීමේදී දිවි තොර කරගැනීම් පිළිබඳ මාධ්‍ය ආචාර ධර්ම අනුගමනය කිරීමත් අත්‍යවශ්‍ය වේ.

එවැනි සිදුවීම් වාර්තා කිරීමේදී,

ප්‍රමුඛතාවයකින් යුතුව මුල් පිටුවේ හෝ ඇතුළු පිටුවක ඉහළ කොටසේ වාර්තා නොකරමු.
දිවි තොර කරගත් ආකාරය සඳහන් නොකරමු.
සිදුවීමට අදාළ අයගේ ඡායාරූප පළ නොකරමු
උපකාරක අංක සඳහන් කරමු

ඒ ඔස්සේ, අනුකාරක සිදුවීම් ඇතිවීමේ ඉඩ අවම කරගත හැක.

විශේෂයෙන්ම සැප්තැම්බර් 10 වන දිනට යෙදෙන ලෝක දිවි තොර කරගැනීම් වැළැක්වීමේ දිනයට ද දින කිහිපයක් තිබියදී, ඝාතන-දිවි තොර කරගැනීමේ සිදුවීමක් මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල නොවන ලෙසින් මෙසේ වාර්තා කිරීම, කෙතරම් වගකීම් සහගත වන්නේ ද?

උපකාරක අංකයක් පළ කරමු, ජීවිතයක් රැක ගනිමු!

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

(මෙම පුවත එදින මෙම පුවත්පත් වල සහෝදර ඉංග්‍රීසි පුවත්පත් තුළ වාර්තා වී නොතිබුණි.)

මූලාශ්‍ර:

https://media.samaritans.org/.../Guidance_for_reporting...
https://www.nsrf.ie/.../Briefing_Murder-suicide_NSRF_26...